# තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

## සංවර්ධන නිලධාරී තනතුරු වලට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීම

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින සංවර්ධන නිලධාරී (Development Officer) (MN-4-Grade III) කොන්ත්‍රාත් තනතුරු 04 ක් සඳහා බඳවාගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් ලබා තිබීම. කෘෂිකර්මය හෝ Industrial Management හෝ ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව උපාධියක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

  සහ

- ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කර පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ඇත.

සහ

**පොදු කොන්දේසි**

**01.** **තනතුර** :- කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ.

**02.** **වයස් සීමාව** :- අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි වියයුතුය.

**03.** **වෙනත්** :-

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වියයුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත වියයුතුය.
- තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වියයුතුය.

**04.** **මාසික දීමනාව** :-
සියලුම දීමනා ඇතුලත්ව රු.36,058/-

**05.** **තෝරා ගැනීමේ ක්‍රමය** :- විධිමත් පරිදි පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර තෝරා ගනු ලැබේ.

**06.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සංවර්ධන නිලධාරී තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම වසරක කාලයකට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| නිර්ණායක | | | ලකුණු | |
|---|---|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | ප්‍රථම උපාධිය | | | 5 |
| | පන්ති සාමාර්ථය | 1st Class | 5 | 10 |
| | | 2nd Class Upper | 3 | |
| | | 2nd Class Lower | 2 | |
| | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | Postgraduate | 3 | 05 |
| | | Diploma /Other (NVQ Level 5) | 2 | |
| ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපෘති කළමනාකරණ පරිගණක මෘදුකාංග භාවිතය | | 5 | 20 |
| | පළපුරුද්ද (වාර්ෂිකව ලකුණු 01 බැගින්) | | 5 | |
| | සකසා ඇති ව්‍යාපෘති වාර්තා | | 10 | |
| ආකල්ප | සූදානම | | 10 | 30 |
| | විෂය බාහිර ක්‍රියාකාරකම් | | 10 | |
| | පෞරුෂය | | 10 | |
| සන්නිවේදන කුසලතා | ඉංග්‍රීසි භාෂාව | | 10 | 30 |
| | දෙමළ/ සිංහල භාෂාව | | 10 | |
| | අදහස් ප්‍රකාශ කිරීම | | 10 | |
| මුළු ලකුණු | | | | 100 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

**07.** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**08.** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

**08.1** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" සංවර්ධන නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම "** යන්න සඳහන් කරන්න

**09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** :- 2018.10.05

මේ සමඟ වන ආදර්ශ අයදුම්පත අනුව සකස් කර ගන්නා අයදුම්පත් 2018.10.05 දිනට පෙර ලැබෙන පරිදි

**" ලේකම්**
**තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**
**අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**රාජගිරිය"**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

**10.** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**11.** අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරිම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**12.** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී.එච්.ආනන්ද
ලේකම් (වැ.බ.)
තිරසර සංවර්ධන, වනජීවී සහ
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
2018.09. 12